SEASL

ශ්‍රී ලංකාවේ නව මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (FIP) පුවත් හසුන 5

ශ්‍රී ලංකාවේ නව මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (FIP) ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ (SEASL) මුලිකත්වයෙන් දියත් කරන ලද්දකි. තවද මෙම ව්‍යාපෘතිය ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත අපනයන සැකසුම් ප්‍රවර්ධනය, නියාමනය හා කළමනාකරණය කිරීම සදහා වගකිවයුතු ශ්‍රී ලංකා රජයේ බලධාරීන් සහ කහවරල් කෙලවල්ලා, ඇස්ගෙඩි කෙලවල්ලා හා සප්පරා මත්ස්‍ය විශේෂ ඇල්ලිම ප්‍රධාන කොටගත් මරුවැල් පන්න බෝට්ටු හිමියන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය විසින් ඇතිකරගන්නා ලද ත්‍රෛපාර්ශ්වීය සහයෝගීතාවයකි. FIP හි මුඛ්‍ය පරමාර්ථය වන්නේ ඉහත සදහන් කල මත්ස්‍ය විශේෂයන්හි ජීව විද්‍යාත්මක සෞඛ්‍යය මට්ටම් සහ එකී මත්ස්‍යයන් බහුලව ගැවසෙන පරිසර පද්ධතීන්හි විවිධත්වය, ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වයට හානි නොවන පරිදි ධිවර කර්මාන්තය කරගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකිරීමයි. මෙකී ව්‍යාපෘතියේ තවත් එක් අරමුණක් ලෙස ජාතික හා ජාත්‍යන්තර නීතිවලට අනුකූලව ක්‍රියාත්මක වන කළමනාකරණ පද්ධතියක් මගින් ධීවරයින්ට ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම පෙන්වාදිය හැකි අතර දිගුකාලින ඉලක්කයක් ලෙස ශ්‍රී ලංකාවෙන් නෙලන මුහුදු ආහාර හා සබැදි වර්තමාන හා අනාගත සමාජ ආර්ථික ප්‍රතිලාභ සළුත කරමින් ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව සැපයුම් ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය වර්ධනය කරගැනීම දැක්විය හැකිය. මසුන් ඇල්ලීම වැඩිදියුණු කිරීම සඳහා FIP හි සාමාජිකයින් විසින් මෑත දී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර FIP පුවත් හසුන 5 වන සංස්කරණයේ විස්තර කර ඇත.

පහත දැක්වෙන සංවිධාන, නියෝජිතායතන සහ අපනයනකරුවන් නව මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (FIP) හි සාමාජිකයින් වේ.

Longline Boat Owners' Associtions

ධීවර කර්මාන්තයේ ජීව විද්‍යාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම

IOTC ගිවිසුමට පක්ෂ අනුකූල වීම (MFAR + IOTC)

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (DFAR) සහ ජාතික ජලජ සම්පත්, පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (NARA) ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය සැප්තැම්බර් මාසයේ ලා රියුනියන් දුපතේ හි පැවති බිල්ෆිෂ් මසුන් පිළිබඳ IOTC ක්‍රියාකාරී සමූහයේ 17 වන සැසිවාරයට සහභාගී වූහ. මිට අමතරව ක්‍රමෝපායන් පිළිබඳ 10 වන ක්‍රියාකාරී සමූහය සහ නිවර්තන ටූනා මත්ස්‍ය සම්පත පිළිබඳ 21 වන ක්‍රියාකාරී සමූහය ඉකුත් ඔක්තෝම්බර් (2019) මාසයේදී ස්පාඤ්ඤයේ දී සහ 22වන විද්‍යාත්මක සමූහය (SC22) දෙසැම්බර් මාසයේදී (2019) පාකිස්තානයේ ද සිය සැසිවාර පවත්වනු ලැබීය . ඉන්දියානු සාගරය ආශ්‍රිත ටූනා මත්ස්‍ය තොගයේ ජීව විද්‍යාත්මක තත්ත්වය සම්බන්ධයෙන් ඉන්දියානු සාගර ටූනා කොමිෂන් සභාවට (IOTC) වාර්තා කිරීමේ අවශ්‍යතා සමග ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමේ අනුකූලතාවයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී.

සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන මත්ස්‍ය තොග තක්සේරු කිරීමේ ක්‍රම සහ මත්ස්‍ය අස්වැන්න පිළිබඳ උපාය මාර්ග ඇගයීම සඳහා ධාරිතා වර්ධනය (NARA+SEASL)

සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන මත්ස්‍ය තොග තක්සේරු කිරීමේ ක්‍රම සහ මත්ස්‍ය අස්වැන්න පිළිබඳ උපාය මාර්ග ඇගයීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ හා ධීවර කළමනාකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ උප ව්‍යාපෘතිය දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී. උප ව්‍යාපෘතිය කොටස් දෙකකින් සමන්විත විය (1) දින තුනක තාක්ෂණික පුහුණුව සහ ධාරිතා වර්ධන වැඩමුළුව (2) ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් (යෙලෝෆින් ටූනා) තොගයට ධීවරයන්ගේ බලපෑම විමර්ශනය කිරීම සඳහා සීමිත දත්ත ක්‍රම භාවිතා කිරීම පිළිබද වැඩමුළුව ඒ අතර විනි. මෙයට අමතරව තෙදින තාක්ෂණික වැඩමුළුවක් ආචාර්ය ටොෂිහිඩේ කිටකාඩෝ විසින් මාර්තු මාසයේ නාරා ආයතනයේ දී පවත්වන ලදී. ආචාර්ය කිටකාඩෝ ක්‍රමෝපායන් පිළිබඳ IOTC ක්‍රියාකාරී සමූහයේ සභාපතිවරයා වන අතර ටෝකියෝ සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සමුද්‍ර ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්යවරයෙකි. ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් තොගයට ධීවරයින්ගේ බලපෑම විමර්ශනය කිරීම සඳහා සීමිත දත්ත ක්‍රම උපයෝගී කර ගනිමින් නව පර්යේෂණ FIP විසින් 2019 මැයි සහ දෙසැම්බර් අතර සිදු කරන ලදී. කහවරල් කෙලවල්ලන් පදනම් කරගත් ධීවර කර්මාන්තයේ භාවිත පන්න ක්‍රම 5ක් පහතින් වේ. (1) මරුවැල් පන්නය (2) වෙනත් පන්න (අත්පන්නය හා දුවන පන්නය), (3) නවීන බිලීපිති පන්නය (4) කරමල් දැල් (5) හැබිලි දැල්. කහවරල් කෙලවල්ලන් සදහා මෙකී පන්නයන්ගේ බලපෑම, මත්සයාගේ දිග පිළිබද IOTC විසින් එක්රැස් කරන ලද(1955 සිට 2015 දක්වා) සංඛ්‍යාත දත්ත භාවිතා කරමින් තක්සේරු කරන ලදී. සීමිත දත්ත ක්‍රම පහක් ලෙස (1) ඇල්ලීමේදී පරිණත මසුන් (2) ප්‍රශස්ථ ප්‍රමාණයෙන් අල්ලා ගන්නා මසුන් (3) ඇල්ලීමේදී බිත්තර සහිත මසුන් (Froese, 2004) (4) සාමාන්‍ය මත්ස්‍ය දිගෙහි වෙනස (Fairtrade USA, 2017) (5) බිත්තර දැමීමේ අනුපාතය සෙවීමට මත්සයාගේ දිග පදනම් කරගත් ප්‍රවේශයක් (Hordyck, et al 2015).ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් සම්පත කෙරෙහි ඉහත සදහන් පන්නයන්ගේ බලපෑම ගණනය කිරීම සඳහා ඉහත කී සීමිත දත්ත ක්‍රම භාවිතයට ගන්නා ලදී.

L_{max}	165 cm
L_{inf}	183 cm
L_m	82 cm
L_{m50}	104 cm
L_{m95}	115 cm
M	0.62
K	0.44
M/K	1.39
L_{opt}	125 cm
-10%	112 cm
+10%	137 cm

මත්සයාගේ දිග පිළිබද සංඛ්‍යා දත්ත මත පදනම්ව සීමිත දත්ත ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී මුලිකව අතීත ජීව පරාමිතීන් (උදා: උපරිම දිග(L_{max}), අසමමිතික දිග (L_{inf}), පරිණතභාවය මත දිග (L_m), මත්ස්‍ය තොගයෙන් 50%ක පරිණතභාවය මත දිග (L_{m50}), ස්වාභාවික මරණ අනුපාතය (M), ස්වාභාවික වර්ධන වේගය(K) සහ ස්වාභාවික වර්ධන වේගය හා ස්වාභාවික මරණ අතර අනුපාතය (M/K)) වැදගත් වේ. මේ සදහා අත්ලාන්තික්, ඉන්දියානු සහ පැසිෆික් සාගරවල කහවරල් කෙලවල්ලන්ගේ ජනගහන ජීව විද්‍යාවට සම්බන්ධ විද්‍යාත්මක ලිපි භාවිතයට ගන්නා ලදී. ආචාර්ය මාරියා ජෝස් ජුවාන් ජෝර්දා විසින් ස්කොම්බ්‍රිඩ් පවුලේ (කෙලවල්ලන් ඇතුළත් වන) ජීවිත ඉතිහාසය පිළිබඳ ගෝලීයව සිදුකරන ලද අධ්‍යයන වාර්තාවක දත්ත වැඩිප්‍රමානයක් මේ සදහා යොදා ගන්න ලදී. ආචාර්ය ජුවාන් ජෝර්දා ඇගේ දත්ත ගබඩාවේ මෘදු පිටපතක් FIP ව්‍යාපෘතිය සමග බෙදාගෙන ඇත. එක් එක් ජීව ඉතිහාස පරාමිතිය සඳහා හොඳම තක්සේරුව (දකුණ බලන්න) ලබාගෙන ඇත්තේ දත්ත සාමාන්‍ය කිරීමේ ක්‍රියාවලියක් මගිනි. 1955 සිට 2015 දක්වා කාලය තුළ IOTC විසින් එකතු කරන ලද කහවරල් කෙලවල්ලන්ගේ දිග පිළිබද සංඛ්‍යාත දත්තයන් සීමිත දත්ත ක්‍රම පහක් ඔස්සේ සලකා බලන ලදී. එයට අදාල ප්‍රතිපල එක් එක් ධිවර පන්න ක්‍රම මගින් ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් තොගයට දක්වන වෙනස් බලපෑම ඉස්මතු කරයි.

මරුවැල් පන්න ධිවර කර්මාන්තයේ දී සම්පුර්ණයෙන් වැඩුණු මසුන් හසුවීමේ ප්‍රතිශතය පසුගිය වසර 60ක කාලය තුළ 80% ට වඩා ඉහළ මට්ටමක පැවතුනි. 2005 සිට මරුවැල් පන්න මත්ස්‍ය අස්වැන්නෙන් 90% කට වඩා වැඩි ප්‍රතිශතයක් සම්පුර්ණයෙන් වැඩුණු මසුන් වේ. එකම කාල පරිච්චේදය තුලදී කරමල් දැල් හා හැබිලි දැල් මගින් 50% කට වැඩි ප්‍රමාණයක් නොමේරූ මසුන් නෙලාගෙන තිබේ. බිලීපිති පන්නය පන්නය යොදාගෙන සිදුකරන ධිවර කර්මාන්තයේදී 90% කට වඩා හසුවන කහවරල් කෙලවල්ලන් නොමේරූ එසේත් නැතිනම් බිත්තර දැමීමට තරම් වර්ධනය නොවූ වයස් කාණ්ඩ වල පසුවෙයි. ෆ්‍රොයිස් (2004) විසින් නිර්දේශිත නිර්ණායකයන්ට අනුව මරුවැල් පන්න හා අනෙකුත් වැල්පන්න ක්‍රම මගින් කහවරල් කෙලවල්ලන් තොගයෙන් ප්‍රමාණයෙන් විශාල අභියනනය කරන්නන් හා ප්‍රශස්ථ මට්ටමෙන් හසුවීමේ ප්‍රතිශතය 1955 සිට (30% - 40%) අතර මට්ටමින් හෝ ඊට ඉහළ මට්ටමක පැවතුණි.කරමල් දැල් සහ හැබිලි දැල් මගින් ප්‍රශස්ථ මට්ටමෙන් මසුන් සුළු ප්‍රමාණයක් නෙලා ගන්නා ලද අතර ප්‍රමාණයෙන් විශාල අභිජනනය කරන්නන් ද සුළු ප්‍රතිශතයක් විය. නවීන බිලීපිති පන්නය යොදාගෙන සිදුකරන ධීවර කර්මාන්තයේ 95% කට වඩා වැඩි ප්‍රමාණයක් උප ප්‍රශස්ත වූ අතර බිලීපිති පන්නය යොදා පන්න කිරීමේදී විශාල අභිජනනය කරන්නන් හසු නොවන තරම්ය.

මරුවැල් පන්න සහ අනෙකුත් ධීවර පන්න ක්‍රම (අත්පන්නය, දුවන පන්නය) මගින් අල්ලා ගන්නා ලද කහවරල් කෙලවල්ලන්ගේ සාමාන්‍ය ප්‍රමාණය පසුගිය අවුරුදු හැට තුළ පළමු පරිණතභාවයේ (සෙ.මී. 82) ප්‍රමාණයට වඩා ඉහළින් පැවතුනි. බිලීපිති පන්නය කරමල් දැල් සහ හැබිලි දැල් මගින් මසුන ඇල්ලීමේ ධීවර කර්මාන්තය හඳුන්වා දුන් 1970 සහ 1980 දශකවල සිට මසුන්ගෙ අස්වැන්නේ ප්‍රමාණය පළමු පරිණතභාවයේ මට්ටමට හෝ ඊට වඩා අඩු විය. මත්සයාගේ දිග මත පදනම්ව සිදුකරන ලද අභිජනන හැකියාව පිලිබඳ තක්සේරු වාර්තාව සීමිත දත්ත ක්‍රම හතරක් උපයෝගී කරගෙන සිදුකරනු ලැබූ පර්යේෂණයක ප්‍රතිඵල පිළිබිඹු කරයි. ඉහත කී තක්සේරු වාර්තාවේ ප්‍රතිඵලවලට වලට අනුව ඉන්දියන් සාගරයේ ඉතිරිව ඇති අභිජනන හැකියාව ඇති කහවරල් කෙලවල්ලන් තොගය මරුවැල් පන්න හා අනෙකුත් වැල්පන්න ක්‍රම මගින් ඉලක්කගත වෙමින් පවතී.

නොමේරූ මසුන් විශාල වශයෙන් බිලීපිති පන්නය, කරමල් දැල් හා හැබිලි දැල් ආශ්‍රිතව හසුවීම ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් තොගයේ වර්ථමාන තත්වය හා අනාගත කළමනාකරණය පිළිබද ඇගවීම් ලබාදෙයි. කහවරල් කෙලවල්ලන්ගේ මත්ස්‍ය තොගයන්ගේ තත්වය පිළිබඳ IOTC හි නවතම තක්සේරු වාර්තාවේ (2018) සාක්ෂි මත පදනම් වූ දත්ත පසක් කරන ලද්දේ දැනට ඉතිරිව ඇති කහවරල් කෙලවල්ලන් තොගය **පමණ ඉක්මවා නෙලාගෙන ඇති** බවත් **පමණ ඉක්මවා නෙලාගැනීමට භාජනය වියහැකි** බවත් ය.











IOTC මගින් ප්‍රකාශයට පත් මසුන්ගේ අභිජනන මට්ටමේ ජෛව ස්කන්ධයට (SB) අනුව අභිජනන මට්ටමේ උපරිම තිරසාර අස්වැන්න (SBmsy) සඳහා වන අන්තර් කාලීන ඉලක්ක යොමු ලක්ෂ්‍යය (TRP) 17% ට වඩා පහළින් සලකනු ලැබූ නමුත් SBmsy පිළිබද අන්තර් සීමාවන් යොමු කිරීමේ ලක්ෂ්‍යය යොමු ලක්ෂ්‍යය (LRP) අගය 0.4 ට වඩා ඉහලින් සළකයි (දකුණ බලන්න). තවද ඇස්තමේන්තු කළ ඇති මසුන්ගේ මරණ අනුපාතය (F) මසුන්ගේ මරණියතාවයට සාපේක්ෂ උපරිම තිරසාර අස්වැන්න (Fmsy) සඳහා වන අන්තර් කාලීන TRP අගය 20%ක් ඉහලින් තිබූ බව ගණන් බලා ඇති නමුත් Fmsy සඳහා වන අන්තර් කාලීන LRP අගය 1.4 ට වඩා අඩුවෙන් සළකයි .

දර්ශක	TRP	2018	LRP
අභිජනන මට්ටමේ ජෛව ස්කන්ධය	1.00	0.83	0.40
ස්වාභාවික මරණ අනුපාතය	1.00	1.20	1.40

IOTC හි තොග විශ්ලේෂණය මගින් ඉන්දියානු සාගරයේ කහවරල් කෙලවල්ලන් තොගය සඳහා රතු ශ්‍රේණිගත කිරීමක් සහිත ව කොබේ ප්ලොට් සටහනක් ජනනය කරන ලදි (දකුණ බලන්න).මේ සඳහා IOTC යේ කළමනාකරණ උපදේශනය වූයේ පමණ ඉක්මවා මසුන් ඇල්ලීම අවසන් කිරීම සඳහා මසුන් ඇල්ලීම අඩු කිරීම සහතික කිරීම හා අභිජනන මට්ටමේ ජෛව ස්කන්ධය උපරිම තිරසාර අස්වැන්නක් (SB_{msy}) මට්ටම් කරා යථා තත්ත්වයට පත්වීමට ඉඩ දෙන ලෙසයි. සීමිත දත්ත ක්‍රම සහ IOTC හි මත්ස්‍ය දිග පිළිබද සංඛ්‍යාත දත්ත භාවිතා කරමින් සිදුකරන ලද FIP ව්‍යාපෘතියේ තක්සේරුකරණ ප්‍රතිඵල වලින් කියවෙන්නේ IOTC විසින් අස්වැන්න අඩු කිරීමේ ක්‍රියාමාර්ග සකස් කර ක්‍රියාත්මක කරන විට එකී පියවරයන් මගින් එක් එක් ධීවර කර්මාන්තයන්ගෙන් මත්ස්‍ය තොගයට ඇති බලපෑම පිළිබිඹු කළ යුතු බවයි.



ධීවර කර්මාන්තයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම

ගිවිසුම්ගත පක්ෂ අනුකූලතාව සමග IOTC (MFAR + IOTC) ගිවිසුම

IOTC ක්‍රියාකාරී සමූහයේ සමුද්‍රික පරිසර පද්ධති, ධීවර දැල්වලට හසුවන අනවශ්‍ය මසුන් සහ වෙනත් සාගර ජීවීන් පිළිබඳ 15 වන සැසිවාරයට DFAR සහ NARA හි ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය සහභාගී විය. බිල්ෆිෂ් පිළිබඳ IOTC ක්‍රියාකාරී සමූහයේ 17 වන සැසිය 2019 සැප්තැම්බර් මස ලා රියුනියන් හි පැවැත්විණි. ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ ඉලක්ක නොකරන ප්‍රධාන බිල්ෆිෂ් මසුන් ලෙස නිල් කොප්පරා ,කළු කොප්පරා සහ පැණි කොප්පරා දැක්විය හැකිය.

ධීවර කළමනාකරණය වැඩිදියුණු කිරීම

ගිවිසුම්ගත පක්ෂ අනුකූලතාව සමග IOTC (MFAR + IOTC) ගිවිසුම

2019 දෙසැම්බර් මාසයේදී පාකිස්තානයේ පැවති අතර IOTC හි සංඛ්‍යාලේඛන හා දත්ත එකතු කිරීම පිළිබඳ 15 වන ක්‍රියාකාරී සමූහයේ සැසියට (WPDCS15) ශ්‍රී ලංකා ධීවර දෙපාර්තමේන්තුවේ (DFAR) හි නියෝජිතයෝ සහභාගී වූහ.

දේශීය නිරීක්ෂක වැඩසටහන (SEAPACT + DFAR)

IOTC හි යෝජනා අංක 11/04 මත පදනම්ව කලාපීය නිරීක්ෂණ යෝජනා ක්‍රමයකට ටූනා (කෙලවල්ලන් අයත්වන) සහ ටූනා වැනි මත්ස්‍ය විශේෂ සඳහා සත්‍යාපිත ඇල්ලීමේ දත්ත සහ වෙනත් විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම සඳහා ගිවිසුම්ගත පාර්ශවයන් අවශ්‍ය වේ. ඉහත කී දත්ත ලබාගැනීම සඳහා මීටර් 24ට වඩා අඩු බහුදින ධීවර යාත්‍රා (එක් එක් ධීවර පන්නය සඳහා) මෙහෙයුම් කරන හෝ පන්න කරන වරු සංඛ්‍යාවෙන් අවම වශයෙන් 5% ක් අනන්‍ය ආර්ථික කලාපයෙන් (EEZ) පිටතදී පන්න කරන්නේ නම් මේ සඳහා දායක කරගත යුතුයි. ශ්‍රී ලංකාව තුල කුඩා ප්‍රමාණයේ එනම් සාමාන්‍ය ප්‍රමාණය මීටර් 12.4ක් පමණ වන බහුදින ධීවර යාත්‍රා 1,350කට වැඩි ප්‍රමාණයක් පවතින අතර මෙම යාත්‍රා ස්වාධීන විද්‍යාත්මක නිරීක්ෂකයින් යෙදවීමට ආරක්ෂිත නොවේ. එහි ප්‍රතිපලයක් ලෙස ශ්‍රී ලංකාවේ EEZ කලාපයෙන් පිටත මීටර් 24 යාත්‍රා මගින් කරන ලද ධීවර චාරිකා වලින් 5% කින් සත්‍යාපිත ඇල්ලීමේ දත්ත සහ වෙනත් විද්‍යාත්මක දත්ත ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවට නොහැකි වී තිබේ.

එනයින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය තුළ මෙම තීරණාත්මක ගැටළුව විසඳීම සඳහා සහ ශ්‍රී ලංකාව IOTC වාර්තාකරණ අවශ්‍යතාවයන්ට අනුකූල වීම වැඩිදියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ EEZ කලාපයෙන් පිටත ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට යාත්‍රා කරන මීටර් 24 ට වඩා අඩු යාත්‍රා සඳහා සත්‍යාපිත ඇල්ලීමේ දත්ත සහ වෙනත් විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම, පර්යේෂණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා දේශීය නිරීක්ෂක වැඩසටහනක් FIP මගින් සකසනු ලැබිණි. දේශීය නිරීක්ෂක වැඩසටහනේ නියමු අදියරෙහි (යාත්‍රා 17ක් /2018 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා) ප්‍රතිඵල වලට අනුව IOTC යෝජනා අංක 11/04 ට අනුකූලව කහවරල් කෙලවල්ලන්, ඇස්ගෙඩි කෙලවල්ලන් සහ සප්පරා මසුන් සඳහා ධීවර කර්මාන්තයට අදාළ සත්‍යාපිත ඇල්ලීමේ දත්ත සහ වෙනත් විද්‍යාත්මක දත්ත 24 m ට වඩා අඩු ශ්‍රී ලංකාවේ බහු දින ධීවර යාත්‍රා වලින් ලබා ගත හැකිය.

වැඩි දියුණු කරන ලද දත්ත එකතු කිරීමේ කෙටුම්පතක් දෙවන අදියරේදී (යාත්‍රා 11 ක් / 2019 අප්‍රියෙල් සිට ජුනි දක්වා) හඳුන්වා දෙන ලද අතර එයින් එක් එක් ධීවර චාරිකාව, ධීවර පන්න ක්‍රමය, පන්න කල දින ගණන නැතහොත් වරු ගණන, මසුන් හසුවූ ප්‍රමාණය සහ හසුවූ එක් එක් මත්ස්‍යයාගේ විද්‍යාත්මක දත්ත (වඳවීමේ තර්ජනයට ලක්ව ඇති, තර්ජනයට ලක් වූ සහ ආරක්ෂිත විශේෂ) ඇතුළුව කලාපීය නිරීක්ෂක දත්ත අවශ්‍යතා 34 ක් රැස් කිරීමට ධීවර දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි. වැඩිදියුණු කරන ලද කෙටුම්පත භාවිතා කිරීමෙන් IOTC යෝජනා අංක 11/04 ට අනුකූලව ස්වාධීනව සත්‍යාපනය කළ හැකි දත්ත 34 ක් සහ වෙනත් විද්‍යාත්මක දත්ත අවශ්‍යතා සමග 98%ක අනුකූලතාවයක් ලබා ගැනීමට DFAR සමත් විය. පුහුණුව, දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ වාර්තා කිරීම සඳහා එක් සංචාරයකට LKR 60,000 (ඇමරිකානු ඩොලර් 330) ක මුදලක් වැය විය.



දේශීය නිරීක්ෂණ නිරීක්ෂණ වැඩසටහන සඳහා SEAPACT සම අරමුදල් සපයන ලද අතර එය ගෝලීය මුහුදු ආහාර සැපයුම් ක්‍රියාවලිය පුරාම ප්‍රධාන භාරකාරත්වයක් ඇති සහ සමාජ, ආර්ථික හා පාරිසරික වගකීම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා කැපවී සිටින උතුරු ඇමරිකානු ප්‍රමුඛ පෙළේ මුහුදු ආහාර සමාගම් සමූහයකි.

ආර්ථික සමානාත්මතාවය සහ සමාජ වගකීම වැඩි දියුණු කිරීම

SLEDB

2019 වසරේ අවසන් මාස හයක කාලය තුල ශ්‍රී ලංකාවේ කහවරල් කෙලවල්ලන්, ඇස්ගෙඩි කෙලවල්ලන් සහ සප්පරා මසුන් සඳහා වන සැපයුම් ක්‍රියාවලියන්හි කිසිදු ආර්ථික සමානාත්මතාවයක් හෝ සමාජ වගකීමක් වැඩි දියුණු කර නොමැත.

ශ්‍රී ලංකා මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ තත්ත්වය යාවත්කාලීන කිරීම

සමුද්‍ර භාරකාර මණ්ඩලය (MSC) අනුමත පූර්ව තක්සේරුව (NESI +SEASL)

ධීවර කර්මාන්තය පිළිබඳ කැප්මරීන් පුද්ගලික සමාගම විසින් 2018 දී පවත්වන ලද MSC අනුමත කළ *පූර්ව තක්සේරුව* අනුව, ඉලක්කගත ප්‍රධාන ධීවර පන්න ක්‍රම තුන MSC ප්‍රමිතීන්ට අනුකූලව (SG > 0.60) කොන්දේසි සහිත අවසරයකින් ස්ථාවර මට්ටමකින් ක්‍රියාත්මක වීම වන බව පවසා සිටියි.

කාර්ය සාධන දර්ශකය	≥80	60-79	<60	සමස්ථය
කහවරල් කෙලවල්ලා	12	14	02	0.68
ඇස්ගෙඩි කෙලවල්ලා	12	13	02	0.69
සප්පරා	12	13	02	0.69

කෙසේ වෙතත්, ඉහත සඳහන් ප්‍රධාන ධීවර පන්න ක්‍රම තුන කාර්ය සාධන දර්ශක දෙකක (PIs) ලකුණු 0.60 කට වඩා අඩුවෙන් ලබා ගත් බැවින් *පූර්ව තක්සේරුව* අසමත් විය . MSC අනුමත *පූර්ව තක්සේරුව* සඳහා නිව් ඉන්ග්ලන්ඩ් සීෆුඩ් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් සම-අරමුදල් සපයන ලදී.



ධීවර ප්‍රගතිය (SEASL)

Fisheryprogress.org වෙබ් අඩවියට අනුව නව ශ්‍රී ලංකා මරුවැල් පන්න FIP ව්‍යාපෘතිය *විස්තීර්ණ ව්‍යාපෘතියක්* ලෙස හුවා දක්වා තිබේ. FIP හි ශ්‍රේණිගත කිරීම් C අක්ෂරයෙන් (මෑත කාලීන ප්‍රගතියෙන්) පටන්ගෙන A අක්ෂරය (උසස් ප්‍රගතිය) දක්වා 2019 දෙසැම්බරයේ වැඩි දියුණු විය. PIs 26 ක් 2018 දී කහ හෝ කොළ ලබා ගත්හ (93%). 2018 දී රතු ලබා ගත් PI දෙකේ ලකුණු 2021 දෙසැම්බර් වන විට කහ වෙත වැඩි දියුණු කිරීමට FIP කටයුතු කරයි. සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් වලින් 43% ක් 2019 දෙසැම්බර් වන විට FIP විසින් සම්පූර්ණ කර ඇත. ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය තවදුරටත් දියුණු කිරීම සඳහා පහත සඳහන් නව ආයෝජන අවශ්‍ය වේ.

1) දේශීය නිරීක්ෂක වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රතිවර්තනය කිරීම හා පුළුල් කිරීම
2) වඳවීමේ තර්ජනයට ලක්ව ඇති, තර්ජනයට ලක්වූ සහ ආරක්ෂිත විශේෂ සජීවීව මුදා හැරීම සහතික කිරීම
3) ධීවර කටයුතු සඳහා රීති සහ මෙවලම් සහිත අස්වනු පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
4) මීටර් 24ට වැඩි යාත්‍රා සඳහා විද්‍යාත්මක නිරීක්ෂක වැඩසටහන වැඩි දියුණු කිරීම
5) නීති විරෝධී නියාමනය නොකළ වාර්තා නොකළ මසුන් ඇල්ලීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2018-2022 වාර්තාව සමාලෝචනය කර යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මුහුදු ආහාර නිෂ්පාදකයින් හත්දෙනෙකු 2019/20 දී මරුවැල් පන්න FIP ව්‍යාපෘතියේ ආයතනික සාමාජිකයින් විය. ***සිලෝන් ෆ්‍රෙෂ් සීෆුඩ් පුද්ගලික සමාගම, ග්ලෝබල් සීෆුඩ් පුද්ගලික සමාගම, ජේ සීෆුඩ් ප්‍රොසෙසින් පුද්ගලික සමාගම, ජෝන් සීෆුඩ් පුද්ගලික සමාගම, ලිහිනි සීෆුඩ් පුද්ගලික සමාගම, නොර්ත් වෙස්ට් ෆිෂරීස් පුද්ගලික සමාගම සහ ට්‍රොපික් ශ්‍රී ලංකා පුද්ගලික සමාගම*** ඒ අතර විය.

මෙහි මෑදු පිටපත් සහ ශ්‍රී ලංකා මරුවැල් පන්න FIP ව්‍යාපෘතියේ පුවත් හසුන් හි පෙර සංස්කරණ ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් ලබා ගත හැකි අතර වැඩි විස්තර ලබා ගැනීමට කරුණාකර steve@pelagikos.lk යන විද්‍යුත් ලිපිනයට ඔබගේ පණිවිඩ යොමු කරන්න.